# <u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2023.03.08</u>
## <u>පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)</u>

2023 වර්ෂයේ I කාර්තු වෙහි I වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2023.03.08 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

2023.03.08 වන දින පෙ.ව.9.30 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කේ.ආර්.අබේසිරිවර්ධන මයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එදින එතුමා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගෙන මෙම කාර්යාංශයෙන් පවත්වනු ලබන කමිටු රැස්වීම්හි සහභාගිවන පළමු කමිටු රැස්වීම මෙය බවත්, මෙම කමිටුවේ ප්‍රධාන අරමුණක් වන්නේ තම ආයතනයේ ඇතිවන අඩුපාඩු නිවැරදි කරගැනීමක් බවත්, එම අඩුපාඩු නිවැරදි කරගැනීමට අදාල මාර්ගය පෙන්වීම විගණනය විසින් පෙන්වා දෙන බවත් එම නිසා විගණන නිලධාරීන් සමඟ සහයෝගයෙන් රාජකාරි කරගෙන යාම අවශ්‍යය බවත් පැහැදිලි කරන ලද අතර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මට්ටමින් ද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සුදුසු බවත් යෝජනා කරමින් රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

<u>සහභාගී වූ නිලධාරීන්</u>

01. කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
02. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
03. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කර්යාලය (බ.ප.)
04. ආර්.ඒ.බී. ඉංද්‍රජිත් මයා - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
05. ඩී.ඩී.චන්ද්‍රානි සේනවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
06. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
07. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
08. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මීගමුව.
09. එච්.ඒ.කේ.ආර්.පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හොරණ.
10. එල්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු පානදුර.
11. එච්.එස්.චන්දන මයා- ප්‍රාදේශීය ඉංජිනේරු මිනුවන්ගොඩ.
12. ඩී.සී.එන්.කලන්සූරිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු රත්මලාන.
13. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු ගම්පහ.
14. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හෝමාගම.
15. ඩබ්.ජී.ආර්.වෙලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මතුගම.
16. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු වත්තල.
17. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු බත්තරමුල්ල.
18. එස්.එස්.මිල්ලනියගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කළුතර.
19. පී.ඩබ්.එන්.ඩී.කුලසිංහ මිය - ගණකාධිකාරී (පොත් තැබීම්) - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
20. ජී.එල්.එස්.ජේ.පෙරේරා මයා - පරිපාලන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
21. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
22. ඩබ්.එන්.සී.කුරේ මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
23. ඩබ්.කේ.එම්.ඩී.එන්.කුලසේකර මෙය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
24. ටී.ජී.එන්.ශ්‍යාමලී මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)

## 01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

| | කාරණය | සාකච්ඡා වූ කරුණු/ තීරණ | වගකීම |
|---|---|---|---|
| 01 | මාසික බැංකු සැසඳුම් | මේ වන විට සියළුම කාර්යාල විසින් මෘදු පිටපත එවන බවත් ඒ ආකාරයෙන්ම දිගටම කරගෙන යන ලෙසත් අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදි. අදාල මස බැංකු සැසඳුම් ඊලග මස 15 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලෙස නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළු ප්‍රාදේශිය ඉංජිනේරුවරු |
| 02 | අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව ණය අය නොවිම. | පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන්ගේ ණය ශේෂ එකවර පියවන ලෙස අදාල පළාත් පාලන ආයතන වෙත දන්වා ඇති බවත්, එම ලිපි සඳහා පිළිතුරු ලෙස අදාල පළාත් පාලන ආයතන මඟින් දන්වා ඇත්තේ, ණය ගෙවිම සඳහා රජය මඟින් මුදල් පළාත් පාලන ආයතන වෙත ලබා නොදෙන බැවින් හා ණය ගෙවීම සඳහා පළාත් පාලන ආයතන විසින් උත්පාදනය කර ගන්නා ලද ආදායම් මඟින් සිදු කරන බැවින්, ණය ශේෂ එකවර පියවිය නොහැකි බවයි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි |

| අනු අංකය | නිලධාරිගේ නම | තනතුර | ස්ථාන මාරුවි ගිය දිනය | 2023.03.24 දිනට අයවිමට ඇත ණය ශේෂය රු. |
|---|---|---|---|---|
| | පළාත් පාලන ආයතන වලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් | | | |
| 1 | ඒ.එස්.අමරසිංහ | කළ.සේවා. සහකාර | 2016.01.16 | 119,319.00 |
| 2 | පී.ජේ.එස්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2018.02.28 | 126,560.00 |
| 3 | එස්.එම්.වඩුගේ | කළමනාකරණ සහකාර | 2018.11.05 | 64,760.00 |
| 4 | සී.කේ.කන්තුලගේ | රියදුරු | 2019.06.03 | 105,890.00 |
| 5 | ඩබ්.ඒ.ටී.එස්.වනිගසුන්ද ර | කළමනාකරණ සහකාර | 2020.01.01 | .126,085.00 |
| 6 | ඩබ්.සී.එස්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.01.17 | 58,860.00 |
| 7 | පී.ජී.එල්.ආලෝකා | තාක්ෂණ නිළධාරි | 2020.02.10 | 149,096.00 |
| 8 | අයි.ජී.ආර්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.02.17 | 137,218.00 |
| 9 | එන්.පී.ඩබ්.ජයවර්ධන | සංවර්ධන නිලධාරි | 2021.12.15 | 86,837.00 |
| 10 | ඒ.එස්.ඒ.සිල්වා | තාක්ෂණ නිළධාරි | 2022.03.31 | 128,415.00 |
| 11 | ඩබ්.එස්.අබේවික්‍රම | කළමනාකරණ සහකාර | 2022.03.28 | 93,520.00 |
| | | | | 1,196,560.00 |

| | | | | |
|---|---|---|---|---|
| | රජයට /වෙනත් පළාත් සභාවකට /පළාත් සභාවේ වෙනත් කාර්යාලයකට ස්ථානමාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ - විදේශධුත සේවය සඳහා | | | |
| 12 | එම්.එච්.ගුණසේකර | කළමානාකාරණ සේවා නිලධාරි | 2020.02.07 | 133,200.00 |
| | | | | |
| | සේවය හැර ගොස් ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | | |
| 13 | ආර්.ජ්.එම්.එම්.රණසිංහ | තාක්ෂණ නිලධාරි | 2013.01.15 | 119,689.00 |
| | | | | |
| | වැඩ තහනම් කර ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | | |
| 14 | පී.ජ්.එල්.එස්.පෙරේරා | විදුලි කාර්මික | 2019.12.03 | 21 696.00 |

| | | | |
|---|---|---|---|
| 03 | කල් ඉකුත්වූ තැන්පතු | අදාළ කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කර ගොඩනැගිලිවල අඩුපාඩු සකස් කරවාගෙන් මෙතෙක් නිදහස් නොකළ තැන්පතු මුදල් කඩිනමින් නිදහස් කිරිමට කටයුතු කරන ලෙසත් එසේ කිරිමට නොහැකි නම් අදාල රුදවුම් ආදායමට ගැනිමට කටයුතු කරන ලෙසත් ප්‍රාදේශීය ඉංජිනේරුවරුවන්ව නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් දැනුවත් කරන ලදි. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 04 | මීගමුව ධීවර සමිතිය | 1. මීගමුව ධිවර සමිති ගොඩනැගිල්ල පළාත් සභාව සතු දේපලක් බැවින් එම දේපල පවරා ගැනිමට අදාල කටයුතු සිදු කිරිම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ පවත්වනු ලබව සාකච්ඡාවට මෙම ගැටළුව සම්බන්ධ කරුණු ඉදිරිපත් කර විසඳා ගැනිමට තිරණය වු අතර ඒ සඳහා මෙම ගැටළුවට අදාල වර්තමාන තොරතුරු ඉදිරිපත් කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු දැනුවත් කරන ලදි.<br><br>බ.ප.ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති පළාත් ඉංජිනේරු කාර්යාංශ විගණකාධිපති වාර්තා විමර්ශන කමිටුව 2019 සාකච්ඡාවේදි මීගමුව ධිවර සමිති ගොඩනැගිල්ල පළාත් සභාව සතු දේපලක් බැවින් ග්‍රාම නිලධාරි දැනුවත් කර පොලිසියේ පැමිණිල්ලක් දමා ඉබි යතුරු කඩා ඉවත් කිරිමට කටයුතු කිරිම සුදුසු බව ප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙන ලද කරුණ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් මීගමුව වෙත දන්වා ලිපියක් යොමු කිරිමට තිරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු |
| | අවිස්සාවේල්ල ඉඩම | 2. අවිස්සාවේල්ල සබරගමුව බස් සමාගම බදු දි ඇති ඉඩම සහිත ගොඩනැගිල්ල සඳහා නව තක්සේරු වටිනාකමට අනුව නව ගිවිසුමකට යාමට ප්‍රධන නීති නිලධාරි සමඟ සාකච්ඡාකර කඩිනමින් ගිවිසුම ගත විමට තිරණය විය.<br><br>අවිස්සාවේල්ල සබරගමුව බස් සමාගමට බදු දි ඇති භූමියේ පවතින ප්‍රාදේශීය ඉංජිනේරු කාර්ලය සතු නිල නිවස පවරා ගැනිමට ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡාකර ඉදිරි කටයුතු සිදු කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරුට පවරන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| | | 3. සියළුම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල පිහිටි භූමි පළාත් සභාවට/ පළාත් ඉංජිනේරු කාර්යාලයට පවරා ගැනීමට, අදාල ප්‍රාදේශීය ලේකම් වරුන් සමඟ සාකච්ඡාකර ඉදිරි කටයුතු සිදුකරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු |
| 05 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | මෙම මෘදුකාංග පද්ධතිය මඟින් ඉංජිනේරු කාර්යාංශයේ උපදේශන අංශයේ කටයුතු, ගොඩනැගිලි අංශයේ කටයුතු හා ආයතන අංශයේ දෛනික තැපැල පවත්වාගෙන යාම සිදු වුවද එහි තවදුරටත් ගැටළුකාරී තත්ත්වයන් පවතින අවස්ථා පැන නැගුනු බැවින් ඒ සම්බන්ධයෙන් අදාල ආයතනය සමඟ 2023.02.16 දින සාකච්ඡාවක් පවත්වා ඔවුන් දැනුවත් කරනු ලැබුවද මෙම මෘදුකාංග පද්ධතියේ තවදුරටත් ගැටළුකාරී තත්ත්වයන් ඇති බව අධ්‍යක්ෂ ඉංජිනේරු පැහැදිලි කරන ලදි.<br><br>මෙම මෘදුකාංග පද්ධතිය සකසනු ලබන APIT ආයතනය හා ITRD ආයතනය සමඟ මෙම ගැටළුකාරී තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡාකර තීරණයක් ගැනීමට තීරණය විය | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්ෂ |
| 06 | වාහන පරිපාලනය සම්බන්ධ | 1. වාහන රියදුරු වෙත භාරදීමේදී / භාරගැනීමේදී විධිමත්ව ඉන්වෙන්ට්‍රියක් මඟින් භාරදීමත් භාරගැනීමත් සිදු කළයුතු බවත්, එම අවස්ථාවේදී පවතින මීටර් අංකය, ඉන්ධන ප්‍රමාණය, සවිකර ඇති ටයර් වර්ගය එහි නිෂ්පාදිත රට,වෙළඳ නාමය ටයර් අංකය, වාහනයේ ඇති බැටරි වර්ගය නිෂ්පාදික රට වෙළඳ නාමය එහි සඳහන් අංකය සටහන් කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු බව,<br><br>2. වාහනයකට ටයර් හෝ බැටරි මාරුකිරීමේදී ඒ බව ලොග් පොතේ සටහන් කළ යුතු අතර එය මාරු කළ දිනය, එහි නිෂ්පාදිත රට, වෙළඳ නාමය, අංකයන් වගකීම් කාලය නිවැරදිව සටහන් කිරීම.<br><br>3. වාහනවල මාසික ධාවන සටහන් සාරාංශය මාස්පතා නියමිත දිනට පරීක්ෂා කිරීම හා නියමිත පරිදි විගණක වෙත ඉදිරිපත් කිරීම.<br><br>4. කිලෝමීටර් 25,000 දුර ප්‍රමණයක් ධාවනය කිරීමෙන් පසු හෝ අවම වශයෙන් වර්ෂයකට වරක්වත් ර.ප.ච.ලේඛ 30/2016 හි 3.1 පරිච්ඡේදය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව සිදු කිරීම.<br><br>5. වාහන වල ආදායම් බලපත්‍ර, දුම් සහතික රක්ෂණ ආවරණ කාලසීමාව අවසන් වීමට පෙර ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර නියමිත වේලාවට බලපත්‍ර ගැනීමට කටයුතු කිරීම.<br><br>6. රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය නොවන සියළුම රජයේ වාහන වල රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම.<br><br>ඉහත කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය සියළුම කාර්යාලවල විෂයභාර නිලධාරීන් සහ රියදුරන් දැනුවත් කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි. | සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු |

| | | | |
|---|---|---|---|
| 07 | කාර්යාල නිල ඇඳුම් | නිල ඇඳුම් හිමි රියදුරන් ඇතුළු සියළුම කාර්ය මණ්ඩලය ආයතන සංග්‍රහයේ XXI වන පරිච්ඡේදයෙන් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව තම නිල ඇඳුමින් රාජකාරි වේලාව තුල සේවයේ යෙදී සිටිය යුතු බව. | සියළුම ප්‍රාදේශීය ඉංජිනේරු. /පරිපාලන නිලධාරි |
| 8 | ව්‍යාපෘති සඳහා අග්‍රිම ඉල්ලුම් කිරිම | සියළුම ව්‍යාපෘති සඳහා අග්‍රිම ඉල්ලුම් කිරිමේදී වැය ලේජර් ගත වන මුදලම ඉල්ලුම් කරන ලෙස (කොන්ත්‍රාත් කරුට ගෙවන මුදල + හරස් සටහන් සඳහා වන මුදල = මුළු මුදල ලෙස අග්‍රිම ඉල්ලිය යුතු බව) නි.ප්‍ර.ලේකම්(මුල්‍ය) විසින් උපදෙස් දුන් බව ප්‍රධාන ගණකාධිකාරි හා නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු |
| 9 | ගිවිසුම් බලධාරිත්වය | ගිවිසුම් බලධරයාගේ එකඟතාවය මත කොන්ත්‍රාත්තුවක් අවසන් කිරිම, රැඳවුම් නිදහස් කිරිම / කොන්ත්‍රාත්තුවේ අවසන් ගෙවිම සිදු කිරිම, විධිමත්ව සිදු කිරිම සුදුසු බව නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි. | සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු |

**2 ) විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරිම්**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | විගණන අධිකාරි විසින් විගණනයෙන් සිදු වන කාර්ය භාරය හා විගණක විසින් සිදු කරන කාර්ය, විගණනයේ අරමුණ කුමක්ද යන්න පිළිබඳවත් කරුණු පැහිදිලි කිරිමක් සිදු කරන ලදි. |
| 2 | විගණනයෙන් බලාපොරොත්තු වන්නේ විමසුම් සඳහා පැහැදිලි කිරිම් ඉදිරිපත් කිරිම පමණක් නොව විගණනයෙන් පෙන්වාදෙනු ලබන අඩුපාඩු නැවත සිදු නොවිමට කටයුතු කිරිම බව, |
| 3. | තවදුරටත් පවතින රැඳවුම් මුදල් කඩිනමින් අවසන් කිරිමට කටයුතු කරන ලෙසත්, |
| 4. | රටේ ඇතිවු ආර්ථික අර්බුධය මත ළඟම පාසැල හොඳම පාසැල ව්‍යාපෘතියට අමතරව නතරවු තවත් ව්‍යාපෘති තවදුරටත් පවති නම් එම ව්‍යාපෘතිහි ප්‍රමුඛතාවය දිය යුතු ව්‍යාපෘති හඳුනාගෙන ඒ සඳහා ප්‍රමුඛත්වය දි කටයුතු කිරිම සුදුසු බව. |

**(3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරිම්**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | බැංකු සැසඳුම් ඉදිරිපත් කිරිම ඉතාම සතුටු දායක බවත්, තවදුරටත් පානදුර, හෝමාගම හා බත්තරමුල්ල ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලවල 2023 ජනවාරි බැංකු සැසඳුම් ඉදිරිපත් කර නොමැති බවත් පසු දින එවිමට කටයුතු කරන ලෙස අදාල ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැන්වත් කරන ලදි. |
| 2. | ව්‍යාපෘති ඇස්තමේන්තුවල අමතර වියදම් ඇස්තමේන්තුගත මුදලින් 10% ඉක්මවා ඇති බව නිරික්ෂණය වු බව |
| 3. | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) හා Complain Management මෘදුකාංගයන් සඳහා විශාල වියදමක් දරා ඇතත් එහි ප්‍රතිඵලයක් තවම නොමැති බවත්. ඒ සඳහා කඩිනමින් ඉදිරි කටයුතු සිදු කිරිම. |
| 4. | කොන්ත්‍රාත් කාලය දිර්ඝ කිරිමේදි ගිවිසුම් කාලයද දිර්ඝ කළ යුතු බව, |

| | |
|---|---|
| 5. | ඉංජිනේරු කාර්යාංශය සතු නිල නිවාස හඳුනාගෙන එම නිවාස කුළියට දිමට කටයුතු කිරිමත් නිල නිවාස ලේඛනය යාවත් කාලින කරන ලෙසත්, නිල නිවස වල පදිංචිකරුවන්ගෙන් නියමිත කුළි අයවනවද යන්න හා ගිවිසුමක් මත නිල නිවාස ලබා දිමට කටයුතු කරන ලෙසත්. |

<u>භාණ්ඩාගාර නියෝජිතගේ අදහස් හා පැහැදිලි කිරිම්</u>

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | මාසික ගිණුම් සාරාංශය (CIGAS) නියමිත දිනට භාණ්ඩාගාරයට එවිමට කටයුතු කරන ලෙස |
| 2. | ප්‍රධන කාර්යාලයේ හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල සිගාස් සම්බන්ධයෙන් ඇතිවන අඩුපාඩු නිවැරදි කර ගැනිමට මහා භණ්ඩාගාරයට යාමේදි අදාල විෂයභාර නිලධාරි සමහ එම කාර්යාලයේ ගණකාධිකාරි/ වැඩ බලන ගණකාධිකාරි හෝ අනිවාර්යයෙන්ම සහභාගි විය යුතු බව, |
| 3. | මාසිකව භාණ්ඩාගාර පොත් හා සැසඳිම් කිරිමේදි ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල වියදම් හා ලැබිම්ද සමඟ සැසඳිම සිදු කළ යුතු බව |
| 4. | ASSEAT තවදුරටත් ආරම්භක ශේෂය ගෙන නොමැති වත්කම් 2023.03.31 දිනට පෙර ආදාල මාසයට ඇතුලත් කරන ලෙස |
| 5. | ව්‍යාපෘති සඳහා අග්‍රිම ඉල්ලුම් කිරිමේදි වැය ලේජර්ගත කරනු ලබන මුදලම ඉල්ලුම් කරන ලෙස |
| 6. | පොදු තැන්පත් කේවල ශේෂ වල සඳහන් වසර 02 ඉක්මවු තැන්පතු වසර 2 ඉක්මවිම මත ආදායමට ගැනිම ලෙස සඳහන් කර ආදායමට ගැනිමට කටයුතු කරන ලෙසත් අවශ්‍ය අවස්ථාවේදි නැවත ඉල්ලුම් කරන ලෙසත් දැනුවත් කරන ලදි. |

විගණන හා කළමනාකරණ කමිටු රැස්විම පැවැත්විම ඉතා වැදගත් බවත්, විගණනයෙන් ලබාදෙන ලද වටිනා අදහස් රාජකාරි කටයුතු වලදි ඉතා ප්‍රයෝජනවත් බවත්, ඉදිරියේදි ඇතිවිය හැකි අඩුපාඩු අවමකර ගැනිමට කටයුතු කරන බවත්, ඔබගේ වටිනා කාලය වැයකර මෙම රැස්විම සඳහා සහභාගි විම සම්බන්ධයෙන් විගණන අධිකාරි, අධ්‍යකෂ - අභ්‍යන්තර විගණක, භාණ්ඩාගාර නියෝජිත, සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා අනෙකුත් සහභාගි වු සියළු නිලධාරින්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතියළුල කිරිමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 12.15 ට පමණ අවසන් කරන ලදි.

කේ.ආර්.අබේසිරිවර්ධන මයා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය,
බස්නාහිර පළාත.